# දෙ වැනි ජුවාම් පාවුලු පාප් වහන්සේ විසින් නිකුත් කරන ලද ‘Familiaris Consortio’ නැමැති ලේඛනයෙහි ඉදිරිපත් කෙරෙන පවුල් සඳහා වන ආත්මික එඬේරික සේවාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඒ. එස්. එල්. රණසිංහ[1]

වතිකානයේ පැවති රදගුරු කතිකාවතෙන් අනතුරු ව දෙ වැනි ජුවාම් පාවුලු පාප් වහන්සේ නිකුත් කළ Familiaris Consortio නමැති ලේඛනයෙහි ඉදිරිපත් කරන පවුල් සඳහා වන ආත්මික එඬේරික සේවාවේ අදියර, ව්‍යුහ සහ කාරක ආශ්‍රිත ව ලාංකේය කිතනු පවුල්වල යහපැවැත්ම පිණිස මෙරට කතෝලික සභාව ගනු ලබන ක්‍රියාමාර්ග සාර්ථක කිතුනු පවුල් දිවියක් සඳහා කෙතෙක් දුරට උපකාරී වන්නේ ද යන්න විමසුමට ලක් කිරීම මේ අධ්‍යයනයේ අරමුණ වෙයි. Familiaris Consortio ලේඛනයේ සතර වන පරිච්ඡේදය පුරා දිවෙන පවුල් සඳහා වන ආත්මික එඬේරික සේවාව පිළිබඳ අධ්‍යයනයෙහි දී ඇති වූ ප්‍රධාන ගැටලුව නම් යුග දිවිය සඳහා තරුණ පිරිස් සූදානම් කරවීමට ලාංකේය කතෝලික සභාව කෙතෙක් ක්‍රියාමාර්ග ගෙන ඇති මුත් ඉතා කෙටි කලක දී කිතුනු විවාහයන් දෙදරා යන අවස්ථාවන් බෝහෝ වන්නේ ඇයි ද යන්න යි. මේ ගැටලුව පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා ප්‍රාථමික දත්ත ලබාගැනීමට සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ ක්‍රම යොදා ගනු ලැබූ අතර ද්විතීයික දත්ත ලබාගැනීම සඳහා ශබ්දකෝෂ, විශ්වකෝෂ, මුද්‍රිත පොත පත, සඟරා වෙබ් අඩවි යනාදිය පරිශීලනය කරනු ලැබිණ. යුග දිවිය සඳහා සූදානම ක්‍රමික හා අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස දූරස්ථ, ආසන්න හා ඉතා ආසන්න ලෙස අදියර තුනක් යටතේ දැකිය හැකි මුත් මෙරට කිතුනු සභාවේ මූලික අවධානය යොමුව ඇත්තේ ඉතා ආසන්න සූදානමට පමණක් වන අතර විවාහයෙන් පසු ප්‍රමාණවත් ආත්මික එඬේරික සේවාවක් දක්නට නොලැබීම මේ ගැටලුව ඇති වීමට හේතුව බව දක්නට ලැබිණ. ඒ අනුව පවුල් දිවියට අදාළ ව ප්‍රමාණවත් අවධානයක් සභාවෙන් නොලැබීම හේතුවෙන් මිළඟ පරපුරේ යහපත සඳහා දූරස්ථ සූදානම ගිළිහෙන බැවින් පවුල් අර්බුද නො කඩවා සිදු වීම වැළැක්විය නොහැක්කක් බවට පත් ව ඇත. එබැවින් විවාහයට පෙර සේ ම විවාහයෙන් පසු ද ගිහියන් කෙරේ කිතුනු සභා අවධානය නො අඩු ව ලැබිය යුතු වේ.

**ප්‍රමුඛ පදඃ** ආත්මික එඬේර සේවාව, සාන්ත සභාව, කිතුනු විවාහ, ලාංකේය කිතුනු පවුල්, දූරස්ථ සූදානම

[1] බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයනාංශය